**11-05-2022** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, බොහෝ කාලයක් පුරා ඔබ වෙන්ව සිටි අතර සම්පූර්ණ උපත් 84ක චරිත කොටස රඟ දක්වා තිබෙනවා. ඔබ දැන් දුකින් පිරි බැඳීම් වලින් ඉවත්ව සතුටින් පිරි සබඳතා වෙත යා යුතුයි. එමනිසා, අසීමිත වූ සතුටින් සිටින්න.

**ප්‍රශ්නය:** නිරන්තර අසීමිත සතුට තිබිය හැක්කේ කුමන දරුවන්ටද?

**පිළිතුර:** 1. බාබා අපව ලෝක පාලකයින් බවට පත්කරවීමට පැමිණ සිටිනවා. 2. අපගේ සත්‍ය වූ බාබා අපට එම ගීතාවේම සත්‍ය වූ දැනුම ලබාදීම සඳහා පැමිණ සිටිනවා. 3. ජීව වන අප දැන් දෙවියන්ගේ උකුළ මත සිටිනවා. ජීව වන අප දැන් අපගේ ශරීර මාර්ගයෙන් පියාට අයිති වනවා. 4. බාබා දැන් අපට භක්තියේ ඵලය වූ විමුක්තිය ලබාදීමට පැමිණ සිටිනවා. 5. බාබා අපව තුන් කාලයම පිළිබඳ දන්නා වූ (ත්‍රිකාල්දර්ශී) දරුවන් බවට පත්කරවා තිබෙනවා. 6. දෙවියන් අපගේ මව ලෙස පැමිණ අපව දරුවන් ලෙස ගෙන තිබෙනවා. අප දෙවියන්ගේ දරුවන්, යන එම විශ්වාසය තිබෙනා, මෙම අවධානය හා ශ්‍රද්ධා විශ්වාසය ඇති දරුවන් තමයි අසීමිත වූ සතුටක් අත්දකින්නේ.

ඕම් ශාන්ති. තමා ජීවාත්මයන්ය යන විශ්වාසය දරුවන් තුළ තිබෙනවා. බාබා, පරමාත්ම දෙවියන් අපට උගන්වනවා. ඉතින් දරුවන් තුළ සැහෙන සතුටක් තිබිය යුතුයි. බාබා ඉදිරියට පෞද්ගලිකවම පැමිණීමෙන්, බාබා සෑම කෙනෙක්ටම විමුක්තිය ලබාදීමට පැමිණ සිටිනා බව ජීවය වටහා ගන්නවා. සැමටම විමුක්තිය ලබාදෙන්නා වන්නේත්, ජීවන මුක්තිය ලබාදෙන්නා වන්නේත් ඔහුයි. මායා නැවත නැවතත් ඔබට ඔහුව අමතක කරවන බව දරුවන් දන්නවා. කොහොමනමුත්, තමා බාබා ඉදිරියේ අසුන්ගෙන සිටිනා බව ඔබට වැටහෙනවා. අශාරීරික වූ බාබා මෙම වාහනය තුළ අසුන්ගෙන සිටිනවා. මුස්ලිම්වරුන් අශ්වයා වටේට රෙදි තිරයක් පෙන්නුම් කරනා අතර මොහොමඩ් එම අශ්වයා පැදවූවා කියාත් කියනවා. ඔවුන් ළඟ එම සංකේතය තිබෙනවා. මෙහිදී, ඒ අශාරීරික බාබා මොහු තුළ ශරීරගත වී තිබෙනවා. දරුවන් සැහෙන සතුටක් අත්විඳිය යුතුයි. ඔබව දිව්‍ය ලෝකයේ හා මුළු ලොවම පාලකයින් බවට පත්කරවනා බාබා දැන් පැමිණ සිටිනවා. ගීතාවේ නියම දෙවියන් බාබායි. ජීවාත්මයේ බුද්ධිය යොමුවන්නේ පරම පියා වෙතටයි. ජීවාත්ම බාබා වෙත දක්වන සෙනෙහස මෙයයි. මෙම සතුට අත්දකින්නේ කුමන දරුවන්ද? බොහෝ කාලයක් තිස්සේ වෙන්ව සිටි දරුවන්ය. බාබාම කියනවා මා ඔබව සතුටේ සබඳතාවය වෙත යවන අතර ඔබ දැන් ඉන්නේ දුකින් පිරි බැඳීම් අතරයි. සෑම කෙනෙක්ම උපත් 84ක් නොගන්නා බව දැන් ඔබට වැටහෙනවා. කෙනෙකුගේ බුද්ධිය තුළ උපත් මිලියන 8.4ක චක්‍රයක් තිබිය නොහැකියි. උපත් 84ක චක්‍රය ගැන බාබා ඔබට ඉතාමත් පැහැදිලිව විස්තර කර තිබෙනවා. බාබාගේ දරුවන් දිගින් දිගටම උපත් 84ක් ගන්නවා. ජීව වන අප මෙම ඉන්ද්‍රිය මාර්ගයෙන් සවන්දෙන බව ඔබ දන්නවා. බාබා මෙම මුඛයෙන් අපට කතා කරනවා. ඔහුම කියනවා මා මෙම ඉන්ද්‍රියන්ගෙන් සහාය ලැබිය යුතුයි. ඔහු බ්‍රහ්මා ලෙස නම් කළ යුතු වනවා. ප්‍රජාපිතා බ්‍රහ්මා මනුෂ්‍යයෙක්ම විය යුතුයි. මිනිසුන්ගේ පියා ඉන්නේ සූක්ෂම ලෝකයේ කියා කියන්න ඔබට බැහැ. පරමාත්ම දෙවියන් මේ භෞතික ලෝකයට පැමිණ මෙසේ කියනවා මා බ්‍රහ්මාගේ ශරීරය තුළට පැමිණ ඔබව දරුවන් ලෙස ගන්නවා. ජීවාත්ම වන අපව ලබාගෙන තිබෙන්නේ පරමාත්ම දෙවියන් විසින් වන බව ජීව වන ඔබ දන්නවා. ශරීරයක් නැතිව ඔබව දරුවන් කරන්න බැහැ. ජීවය කියනවා මා මෙම ශරීරය මාර්ගයෙන් ඔබට අයත් වනවා. ඔහු මෙම ශරීරය ගෙන තිබෙන්නේ ණයටයි. මෙම ශරීරය ඔහුට අයිති නැහැ. ජීවාත්මය ශරීරය තුළට ඇතුළු වී තිබෙනවා. ජීවාත්ම වන ඔබත් ශරීරයක් තුළට ඇතුළු වී සිටිනවා. බාබා කියනවා මා මොහු තුළට ඇතුළු වී සිටිනවා. සමහරවිට, මා දරුවා වන අතර සමහර විට මා මවද වනවා. මැජික්කරුවා ඔහුයි. දරුවනි, මේවා ක්‍රීඩාවක් ලෙස ඔබ සළකනවා. ලෝකයේ බොහෝ සෙයින් වැරදි සෘද්ධි බල ගැන කියැවෙනවා. ඔවුන් ක්‍රිෂ්ණා බවටත් පත්වෙනවා. ක්‍රිෂ්ණා ගැන විශ්වාස කරනා අයට ඉක්මණින්ම ක්‍රිෂ්ණා දැකගත හැකිවන අතර, එවිට එම පුද්ගලයාව විශ්වාස කොට ඔහුගේ අනුගාමිකයින් බවට පත්වෙනවා. මෙහිදී, සෑම දෙයක්ම දැනුම පිළිබඳ වූ ඒවායි. පළමුවෙන්ම තමා ජීවයක්ය යන විශ්වාසය ඔබ තුළ තිබිය යුතුයි. බාබා කියනවා මා ඔබගේ පියායි. මා ඔබව තුන් කාලයම ගැන දන්නා වූ දරුවන් බවට පත් කරවනවා. එවන් වූ දැනුමක් දෙන්න වෙන කාටවත් බැහැ. භක්ති මාර්ගයේ අවසානය වන විට, එම අවස්ථාවේදී තමයි පියා මෙහි පැමිණෙන්නේ. බොහෝ මිනිස්සු ශිව ලින්ගම් හෝ නිරන්තර, සදාකාලික ආලෝක ස්වරූපයක දර්ශන දකිනවා. කෙනෙකුගේ

විශ්වාසය කුමක්ද, භක්තිය කුමක්ද මා ඒ ඕනෑම දෙයක් ඉටු කරනවා. කොහොමනමුත්, ඒ කිසිම කෙනෙක්ට මා හමුවීමට බැහැ. ඔවුන් කිසිසේත් මා හඳුනාගන්නේ නැහැ. බාබා තිතක් බවත් අප ද තිතක් වන බවත් ඔබට දැන් වැටහෙනවා. මම, මේ ජීවාත්මය වන මා තුළම මෙම දැනුම තිබෙනවා. ජීවාත්ම වන ඔබ තුළත් මෙම දැනුම තිබෙනවා. කිසිම කෙනෙක් අප ඒ උත්තරීතර දනව්වෙහි සිටිනා බව දන්නේ නැහැ. ඔබ බාබා ඉදිරියට පැමිණ ඉඳගත් විට ඔබගේ හිරිගඩු පිපෙනවා. 'ඔහෝ! ශිව බාබා, දැනුමේ සාගරය වූ ඔහු මොහු තුළට පැමිණ අපට උගන්වනවා!' ක්‍රිෂ්ණා හෝ ගෝපීන් පිළිබඳ ප්‍රශ්නයක් මෙහි නැහැ. ඔවුන් මෙහි ඇත්තේත් නැහැ, ස්වර්ණමය යුගයේ ඇත්තේත් නැහැ. එහි සෑම කුමරෙක්ම තම තමන්ගේ මාළිගාවල වාසය කරනවා. මෙහි පැමිණ පියාගෙන් තම උරුමය හිමිකරගන්නා අය පමණයි මේවා තේරුම් ගන්නේ. ඔබ තුළ මෙම සතුට තිබිය යුතුයි. ඔවුන් කියනවා 'මව හා පියා ඔබයි.' නමුත්, ඔවුන්ට එහි අර්ථය වැටහෙන්නේ නැහැ. පියා ඔහුයි. එසේනම්, මව කවුද? මෙහිදී මව් කෙනෙක් අනිවාර්යයෙන්ම අවශ්‍ය වනවා. මේ අම්මාට, අම්මා කෙනෙක් සිටිය නොහැකියි. මෙම රහස ඉතා පැහැදිලි ලෙස වටහාගත යුතු වනවා. ජීව වන ඔබ පියාව සිහිපත් කළ යුතුයි. පියා කියනවා ඔබ තුළ කිසිම නරක දෙයක් නොතිබිය යුතුයි. ඔවුන් ගායනා කරනවා මා ගුණාංගයන්ගෙන් තොරයි. මා තුළ කිසිම ගුණාංගයක් නැහැ. දරුවන් දැන් ගුණාංගයන්ගෙන් පිරිය යුතුයි. ඔබ තුළ රාගය, කෝපය හෝ කිසිම උඩඟු බවක් නොතිබිය යුතුයි. ඔබ දැන් මෙහි අසුන්ගෙන සිටිනවා තමා මෙහි සිටිනා බව ඔබ දන්නවා. ඉතින් ඔබ පරවී යන්නේ ඇයි? කොහොමනමුත්, ඔබගේ තත්ත්වය ස්ථිර තත්ත්වයකට පත්වන්නේ අවසානයේදී පමණයි. මෙවැනි දෙයක් සිහිපත් වනවා අතීන්ද්‍රිය සතුට ගැන දැනගැනීමට ඔබට අවශ්‍ය නම්, ගොපලු ගොපලියන්ගෙන් අහන්න. මෙය සිදුවන්නේ අවසානයේදීයි. කාලයෙන් 75%ක් තමා අතීන්ද්‍රිය සතුටින් ඉන්නවා කියා කියන්නට කිසිම කෙනෙක්ට බැහැ. මෙකල වන විට ඔබ තුළ සෑහෙන පාප බරක් තිබෙනවා. ගුරු කෙනෙකුගේ ආශීර්වාදවලින් හෝ ගංගා තුළ ස්නානය කිරීමෙන් පාප නැතිකර දැමිය නොහැකියි. අවසානයේදී පමණයි පියා මෙහි පැමිණ ඔබට දැනුම දෙන්නේ. කුමාරී කෙනෙක් හීයක් විදීමෙන් ඔහු (බිෂම්පිතා) මිය යන ආකාරය ඔවුන් පෙන්නුම් කර තිබෙනවා. ඔහු මිය යන විට ඔහුට ගංගාවල ජලය බීමට දුන්නා. මෙහිදී ඔබ අසිහියට පත්වූ විට, ඔබට බාබා සිහිකිරීමට කියනවා නිරන්තරයෙන් මා පමණක් සිහිපත් කරන්න. දරුවන් මෙම පුරුද්ද ඔබ තුළ ඇතිකර ගත යුතුයි. කෙනෙක් තමාට මතක්කර දිය යුතුයි කියා කාවවත් දිහා බලන් සිටිය නොයුතුයි. ශරීරය අත්හැර යන අවස්ථාවේදී නිරායාසයෙන්ම ඔබට බාබා සිහිපත් විය යුතුයි. කිසිම කෙනෙකුගේ සහායක් නැතිව ඔබ බාබා සිහිකළ යුතුයි. මිනිස්සු මන්ත්‍ර දෙනවා. නමුත් එය සාමාන්‍ය දෙයක්. ඒ කාලයේදී නොයෙකුත් ආකාරයේ සටන් හා බිහිසුණු ක්‍රියා ඇති වනවා. ඔබ වෙනස් වෙනස් ස්ථානවල ඉදියි. ඒ වෙලාවට ඔබට ශිවා ශිවා කියමින් ඉන්න බැහැ. ඒ අවස්ථාවේදී ඔබ සම්පූර්ණයෙන්ම ඔහුගේ ස්මරණයෙහි සිටිය යුතු අතර ඔහුට එම ආදරය දැක්විය යුතුය. ඔබට පළමු නොම්මරයේ තත්ත්වයක් හිමිකර ගත හැක්කේ එවිට පමණයි. මා ඔබගේ පියා වන බව දරුවන් දන්නවා. මීට ඉහත කල්පයේදී පවා මා ඔබව ලස්සන කළා. සත් යුගයේදී යෝග බලයෙන් මල් වැනි දරුවන් උපදිනවා. දුක් දෙන කිසිම දෙයක් එහි නැහැ. එහි නමම දිව්‍ය ලෝකයයි! කොහොමනමුත්, භාරතයේ මිනිසුන් එහි වාසය කරන්නේ කවුද යන්න ගැන දන්නේ නැහැ. ඔවුන් හිරණ්‍යකශ්‍යප ආදී අය ගැන නොයෙකුත් කතා ආගමික ග්‍රන්ථවල ලියා තිබෙනවා. මේ සෑම දෙයක්ම භක්තියේ සැරසිළි පමණයි. භක්තිය පවා මුලදී සතෝප්‍රධාන් වූවා. පසුව එය කෙමෙන් කෙමෙන් තමෝප්‍රධාන් වූවා. පියා කියනවා මා ඔබව ආකාශය වෙත ගෙන යන නමුත් ඔබ කෙමෙන් කෙමෙන් පහළටම බසිනවා. මනුෂ්‍යයින් ගැන කිසිම ප්‍රශංසාවක් ඇත්තේ නැහැ. සෑම කෙනෙකුටම විමුක්තිය ලබාදෙන්නේ ඒ එකම එක පියායි. ගුරුන් ඔබට නොයෙකුත් ආකාරයේ වන්දනා ගමන් ආදිය යන ආකාරය උගන්වනවා. ඒ වෙනුවට, ඔබ දිගින් දිගටම වැටෙනවා. භක්ති මාර්ගයේ මීරා දර්ශන දැක්කා වුවත් ඇය ලෝක පාලකයෙක් බවට පත්වූයේ නැහැ. බාබා ඔබට ජීනීලා වන්නැයි කියනවා. මා ඔබට යමක් කිරීමට දෙනවා ඇල්ෆා හා බීටා පමණක් සිහිකරන්න. ඔබ වෙහෙසට පත්වී මා සිහි නොකළහොත්, මායා ඔබව අමු අමුවේ කා දමයි. කෙනෙක්ව අමු අමුවේ කා දැමූ ආකාරයේ ජීනීගේ කතන්දරයක් තිබෙනවා. බාබා කියනවා ඔබ මා සිහි නොකළහොත්, මායා ඔබව අමු අමුවේ කාදමයි. ඔබ ස්මරණයෙහි යෙදෙන විට සෑහෙන සතුටක් අත්විඳිනවා. බාබා අපව ලෝක පාලකයින් බවට පත්කරවනවා. බාබා ඔබ ඉදිරියේම අසුන්ගෙන සිටිනවා. ජීව වන ඔබ ඔහුට සවන්දෙනවා. මිහිරි, ආදරණීය දරුවනි, මා පැමිණ සිටින්නේ ඔබව විමුක්ති දේශය වෙත ගෙනයාම සඳහායි. බොහෝ මිනිස්සු නැවත ගෙදර යාමට උත්සාහ කළත්, ඒ කිසිම කෙනෙක්ට එය කරන්න බැහැ. කලි යුගයට පසු සත් යුගය පැමිණිය යුතුමයි. රාත්‍රියෙන් පසු උදෑසන පැමිණිය යුතුමයි. ස්වර්ණමය යුගයේ ඉන්නේ අප පමණක් බව ඔබ දන්නවා. බාබා දැන් නැවතත් අපට අපගේ රාජ්‍යය නම් වූ වාසනාව ලබා දෙනවා. සතුටේ ප්‍රමාණය වර්ධනය වන්නේ

අවසානයේදීයි. විනාශය සිදුවන්නේ අවසන් මොහොතේදීයි. ඔබ සෑම දෙයක්ම නොබැඳි නිරීක්ෂකයින් සේ බලා සිටිනවා. එහිදී කිසිම හේතුවකින් තොරව ලේ වැගිරීම් සිදුවනවා. බෝම්බවලින් සෑම කෙනෙක්ම මරා දැමීමට මිනිසුන් කර ඇති සැහැසි ක්‍රියාව කුමක්ද? කෙසේවෙතත්, සෑම කෙනෙක්ම මිය යනවා. තම සිතට එකඟ නොවී කෙනෙක් එම බෝම්බ නිපදවීමට පොළඹවනවා කියා ඔවුන් විශ්වාස කරන්නට පටන් ගන්නවා. එහිදී සෑහෙන වියදමක් සිදුවනවා. ඔවුන් මාර්ගයෙන් විනාශය සිදුවීම, නාටකයේ එලෙසින්ම තීරණය වී තිබෙනා දෙයකි. තවත් ආගම් ගණනාවක් මධ්‍යයේ එකම ආගමකට සෑවොම පාලනය කළ නොහැකියි. දැන් මේ තිබෙනා ගණන් කිරීමටවත් නොහැකි වූ ආගම් සංඛ්‍යාව විනාශ වී එකම එක ආගමක් පමණක් ස්ථාපනය වීමටයි තිබෙන්නේ. බාබාගේ ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් අප රාජ්‍යය ස්ථාපනය කරනා බව ඔබ දන්නවා. මිනිස්සු සටන් සරඹ ඉගෙන ගැනීමට පිටියට යනවා. මරා දැමිය යුතු බව හෝ තමා මැරුම් කෑ යුතු බව ඔවුන් දන්නවා. මෙහිදී එවැන්නක් සිදුවන්නේ නැහැ. බාබා පැමිණ සිටිනවා යන්න ගැන ඔබ තුළ සෑහෙන සතුටක් තිබිය යුතුයි. ඒ අශාරීරික වූ දෙවියන් තමයි භාරතයේ පෞරාණික වූ රාජයෝගා ක්‍රමය ඉගැන්වූයේ. ඔවුන් නම වෙනස් කර ක්‍රිෂ්ණාගේ නම ඊට යෙදුවා. තමා කරනා යෝගා ක්‍රමය පෞරාණිකම යෝගා ක්‍රමයයි කියා සන්‍යාසීන් විශ්වාස කරනවා. සෑම දෙයක්ම ගැන ඔබට ඉතාමත් පැහැදිලි ලෙස විස්තර වනවා. දරුවනි, ඔබ මා හඳුනාගෙන තිබෙනවාද? මා ඔබගේ පියායි. පාරිශුද්ධකරුවා සහ දැනුමේ සාගරය ලෙස හැඳින්වෙන්නේ මමයි. ක්‍රිෂ්ණාට අපිරිසිදු ලෝකය වෙත පැමිණිය නොහැකියි. ඔවුන් තඹ යුගයේ ක්‍රිෂ්ණාව පෙන්නුම් කර තිබෙනවා. එය ඉතා විශාල වැරැද්දක්. භක්ති කරනා අතරම, ඔවුන් සම්පූර්ණ තමෝප්‍රධාන් තත්ත්වයට පත්ව තිබෙනවා. මා පැමිණෙන්නේ සෑම කෙනෙක්වම විමුක්තියේ දේශය වෙත ගෙන යාමට තිබෙනා විටයි. තමා ඉගෙනගන්නා බව ඔබ දන්නවා. අප දේව දරුවන්. දිගින් දිගටම මෙසේ ආවර්ජනය කරන්න. එවිට ඔබ තුළ සතුටේ හිරිගඩු පිපෙයි. බාබා දරුවන්ට දැනුම පිළිබඳ වූ සියලු කරුණු කියා දෙනවා. ඉතින්, ඇයි ඔබ ඒවා අමතක කරන්නේ? දරුවෙක් ඉපදුණු ගමන් ඔහු මෙසේ කියන්නට පටන් ගන්නවා 'බාබා'. තමා උරුමක්කරුවන් බව ඔබට වැටහෙනවා. එමනිසා, නිරන්තරයෙන්ම සීයාව සිහිකරන්න. බාබා ඔබට උපදේශය දෙනවා දරුවනි, ලොකුම සතුරා රාගයයි. එය එහි ආරම්භයේ සිට අවසානය වන තෙක්ම ඔබව බොහෝ දුකට පත්කර තිබෙනවා. මෙය මරණයේ දේශයයි. මෙය ගණිකා මඩමක්. රාමා, ශිවාලය නිර්මාණය කරනවා. එය තමයි දේවතාවන්ගේ රාජ්‍යය තිබෙන්නා වූ කෝවිල. කොහොමනමුත්, ඔවුන් තම රාජ්‍යය කෙසේ, කවදා ලබා ගත්තේද? ඔබ දැන් මෙය දන්නවා. දේවී දේවතාවන් කිසිම විටෙක නැවත නැවතත් උපත් ගන්නේ නැහැයි කියා මිනිස්සු සිතනවා. යම් වැදගත් පුද්ගලයෙක් මෙය වටහාගතහොත්, ඔහුගේ හඬ ව්‍යාප්ත කළ හැකියි. දුප්පත් අයට කිසිම කෙනෙක් සවන් දෙන්නේ නැහැ. ඔබ අතරිනුත් අනුපිළිවෙලින් මෙය ධාරණය කරගන්නා අය ඉන්නවා. මේ එකම එක පාසලෙහි එකම එක ගුරුවරයායි. නමුත් ශිෂ්‍යයින් සෑම කෙනෙක්ම ඉන්නේ අනුපිළිවෙලිනි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. මායාගේ ඕනෑම ආකාරයක පහරකින් බේරීම සඳහා, ජිනී කෙනෙක් බවට පත්වී දිගින් දිගටම ඇල්ෆා සහ බීටා සිහි කරන්න. යෝගා බලයෙන් ඔබගේ හිස මත තිබෙනා පාප බර ඉවත් කර දමන්න. අතීන්ද්‍රිය සතුටින් ඉන්න.
2. ඔබගේ දෙතොල්වලින් පමණක් ශිවාගේ නම මතුරන්න එපා. පියා කෙරෙහි සත්‍ය වූ සෙනෙහස ඇතිකර ගන්න. කටු මල් බවට පත් කිරීමේ කාලය මෙයයි. එමනිසා, මෙම සේවයෙහි කාර්යබහුල වන්න.

**වරදානය:** ඔබේ සැහැල්ලු තත්ත්වයෙන් නිරවද්‍ය විනිශ්වයක් කරමින් ඔබේ බුද්ධියේ විශ්වාසය ඇතිව ඔබ ජයග්‍රාහී මිණිමුතුවක් වේවා.

නිරන්තරව ජයග්‍රාහකයන්වීම සඳහා වූ පහසු මාර්ගය නම්, එක් ශක්තිය සහ එක් ආධාරකය තිබීමය. ඔබ එක්කෙනෙක් කෙරෙහි විශ්වාසය තබන්නේ නම් ඔබට බලය ලැබෙනවා. විශ්වාසය ඔබව නිරන්තරයෙන් සැහැල්ලු කරවන අතර සැහැල්ලු තත්ත්වය තිබෙන අය

විසින් කරනා සෑම ක්‍රියාවකින්ම ඔවුන් සාර්ථක වෙනවා. සැහැල්ලුවෙන් සිටීම මඟින් ඔබේ බුද්ධියට නිරවද්‍ය විනිශ්චය කිරීමට හැකි වේ. එමනිසා, නිරවද්‍ය විනිශ්චයන් කිරීමේ පදනම වන්නේ විශ්වාසනීය බුද්ධියක් සහ සැහැල්ලු වී සිටීමත් වේ. ඔබ හුදෙක් පරම පියා අනුගමනය කරන නිසා ඔබට සිතීමට පවා උවමනා නොවේ. ඔහුගේ පියවර මත ඔබේ පියවර තබා ඔබට ලැබෙන ශ්‍රීමත් අනුව ඒ ඔස්සේ ගමන් කරන. සරළව ඔබේ පියවර ශ්‍රීමත්වල පියවර මත නොකඩවා තබන්නේද ඔබ ජයග්‍රාහී මිණිමුතුවක් වේවි.

**පාඨය:** සියල්ලන් උදෙසා ත්‍යාගශීලී හැඟීම් ඇතිව සිටීම යනු ලෝක පරිත්‍යාගශීලයෙකු වීමයි.

***** ඕම ශාන්ති *****

**මාතේශ්වරීජීගේ අමිල උසස් වදන්**

අප දැන් සංගම යුගයේ දී ලබමින් සිටින දේවමය ඥානය අපට ස්වර්ණම යුගයේ දීත් ලැබේවි ද? මේ සඳහා විස්තරයක් දී තිබෙනවා. එනම්, ස්වර්ණම යුගයේ, අපම ඥානයේ ප්‍රතිරූපයන්වී සිටීවි. අප එහිදී අපගේ දේවතා ප්‍රතිඵලය අත්විඳිමින් සිටීවි. එහිදී ඥානයේ හුවමාරුවක් නොතිබේ. එසේ වන්නේ ඥානය නැති සහ ඥානය අවශ්‍ය කරන අයටයි. ස්වර්ණම යුගයෙහි සියල්ලන්ම ඥානයේ ප්‍රතිමූර්තින් වේ. එහිදී ඥානය දීමට තරම් අවශ්‍යතාවයක් හෝ අඥාන එක්කෙනෙක් හෝ නොසිටිනු ඇත. මේ කාලේ, මුළු අසීමිත නාටකයේ ආරම්භය, මධ්‍යය සහ අන්තය අප දන්නවා. ආරම්භයේදී අප කවුරුත් වූයේද? අප පැමිණියේ කොහි සිටද? අප අතරමැද කර්ම බන්ධනයෙහි පැටළුනේ කොහොමද සහ පහළට වැටුණේ කොහොමද? අවසානයේදී, අප කර්ම බන්ධන ඉක්මවා යන්නත් ඕන සහ කර්මාතීත් දේවතාවරුන් බවට පත්වෙන්නත් ඕන. අප විසින් දැන් කරන උත්සාහයෙන්, අපට ස්වර්ණම යුගී දේවතාවරුන් වීමේ අනාගත ප්‍රතිලාභය ලැබේවි. එහිදී දේවතාවරුන් වූ අපට පහළට වැටෙනු ඇතැයි යන දැනුම තිබේ නම්, එම සිතිවිල්ලෙන්ම අපගේ සතුට අතුරුදහන් වී යනු ඇත. එමනිසා, අපගේ වැටීම පිළිබඳ දැනුම අපට එහිදී නොතිබේ. මේ සිතිවිලි එහිදී නොතිබේ. මෙම දැනුම තුළින් අප දැන් ඉහළට යා යුතු බවත් අපගේ සතුටුදායක ජීවිතය නිර්මාණය කරන්න ඕන බවත් අප දැන් දන්නවා. අපගේ ප්‍රතිලාභය අඩ චක්‍රයක් පුරා අප අත්විඳිනවා ඇත. ඉන්පසු අපවම අමතක වී, මායාගේ බලපැවැත්වීමට යටවී අප පහළට වැටෙනවා. මෙම ඉහළ නැඟීම සහ පහළ බැසීම අනාදිමත් කලින් නියම වූ නාටකයකි. මේ සියලු දැනුම අපගේ බුද්ධියෙහි මේ කාලයේ තිබේ. ස්වර්ණමය යුගයෙහි නොතිබේ. අච්චා.